*සැ. යු.* - 2015.04.30 වැනි දින පළ වූ අංක 1,913 දරන ගැසට් පත්‍රයේ I : III, II සහ III කොටස් පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,914 - 2015 මැයි මස 08 වැනි සිකුරාදා - 2015.05.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 672 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 676 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 679 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 686 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 691 |


*සැ. යු.*- විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත, සහ ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2015 මාර්තු මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 මැයි මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මැයි මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ටෙන්ඩර් දැන්වීම

**රත්මලාන දුම්රිය අංගනයේ ගර්හිත වානේ ටයර්, ඩිස්ක් සහ ගර්හිත කොයිල් ස්ප්‍රිං අපහරණය කිරීම**

SRS/F. 7210

කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය මූලස්ථානය, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) සභාපති විසින්, රත්මලාන දුම්රිය අංගනයේ ඇති ගර්හිත වානේ ටයර්, ඩිස්ක් සහ ගර්හිත කොයිල් ස්ප්‍රිං අපහරණය සඳහා මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. 2015.05.29 වැනි දින ප. ව. 2.00 ට ලංසු අවසන් කරනු ලැබේ.

03. දුම්රිය සේවයේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය වෙත ගෙවිය යුතු වූ රු. 10,000.00 (රුපියල් දස දහසක) ආපසු නොගෙවන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීම මත, 2015.05.28 වැනි දින ප. ව. 3.00 දක්වා කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මත ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය මූලස්ථානයේ දී ලංසු අවසන් කිරීමේ වේලාවෙන් පසුව, වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසු කරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්හට ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගි වන ලෙස ආරාධනා කරනු ලැබේ.

05. ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ පෞද්ගලිකව පැමිණ හෝ භාරදිය යුත්තේ,

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කොට් මාවත,
කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂාකර බැලීමට පුළුවන.

07. වැඩිදුර විස්තර සඳහා කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ, දුම්රිය ගබඩා අධිකාරී අමතන්න.

දුරකථන අංක : 2438078 /2436818
ෆැක්ස් අංකය : 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.slrail.info

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7210.

05-150

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන නිවේදනය

**අශ්වබල 100, මුළු වාහන බර කි. ග්‍රෑ. 5,000 4 WD කෲ කැබ් ට්‍රක්ස් (4WD Wide Crew Cab Trucks) 04ක් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා සැපයීමේ ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7228

ටොන් 5 වාහන බර (GVW) වයිඩ් කෲ කැබ් ට්‍රක් 04ක් සැපයීම සඳහා කොළඹ, තැ. පෙ. 355, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයෙහි දුම්රිය මූලස්ථානයෙහි ප්‍රසම්පාදන කමිටු දෙපාර්තමේන්තුවෙහි සභාපති විසින් මුද්‍රා තබන ලද ලංසු සැපයුම්කරුවන්ගෙන් භාරගනු ලබයි.

02. ලංසු භාරගැනීම 2015.05.21 වැනි දින ප. ව. 2.00 ට කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවා සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී අවසන් වේ.

03. ලංසු ඉදිරිපත් කිරීම, ආපසු ගෙවනු නොලබන රු. 5,000 ක ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් 2015.05.20 වැනි දින පස්වරු 3.00 දක්වා ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල පමණක් ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවා සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී ලංසු විවෘත කිරීම සිදු කෙරේ. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පැමිණෙන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදිය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය මූලස්ථානය,
ඔල්කට් මාවත,
කොළඹ 10.

06. වැඩිදුර විස්තර සඳහා මෙසේ විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කට් මාවත,
කොළඹ 10.

දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7228.

05-151

### ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන නිවේදනය

**අශ්වබල 250, මුළු වාහන බර කි. ග්‍රෑ. 25000 ඩම්ප් ට්‍රක් රථ 01ක් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා සැපයීමේ ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7227

අශ්වබල 250, මුළු වාහන බර (GVW) කි. ග්‍රෑ. 25,000 ඩම්ප් ට්‍රක් රථ 01ක් සැපයීම සඳහා කොළඹ, තැ. පෙ. 355, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයෙහි, දුම්රිය මූලස්ථානයෙහි, ප්‍රසම්පාදන කමිටු දෙපාර්තමේන්තුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද ලංසු සැපයුම්කරුවන්ගෙන් භාරගනු ලබයි.

02. ලංසු භාරගැනීම 2015 මැයි මස 22 වැනි දින පස්වරු 2.00 ට කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවා සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී අවසන් වේ.

03. ලංසු ඉදිරිපත් කිරීම ආපසු ගෙවනු නොලබන රු. 5,000 ක ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් 2015 මැයි මස 21 වැනි දින ප. ව. 3.00 දක්වා ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල පමණක් ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවා සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී ලංසු විවෘත කිරීම සිදු කෙරේ. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පැමිණෙන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.

06. වැඩිදුර විස්තර සඳහා මෙසේ විමසන්න. දුම්රිය ගබඩා අධිකාරී, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1347, ඕල්කට් මාවත, කොළඹ 10.

දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2473328
ෆැක්ස් අංකය : 94 (11) 2432044
ඊමේල් : Srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7227.

05-152

### ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන නිවේදනය

**විදුලිය මාස්ට් ලිෆ්ට් (Electric Mast Lifts) 02ක් ප්‍රසම්පාදනය කිරීම**

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7166

ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා විදුලිය මාස්ට් ලිෆ්ට් 02ක් සැපයීම සඳහා කොළඹ, තැ. පෙ. 355, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයෙහි, දුම්රිය මූලස්ථානයෙහි, ප්‍රසම්පාදන කමිටු දෙපාර්තමේන්තුවෙහි සභාපති විසින් මුද්‍රා තබන ලද ලංසු සැපයුම්කරුවන්ගෙන් භාරගනු ලබයි.

02. ලංසු භාරගැනීම 2015.06.04 වැනි දින ප. ව. 2.00 ට (ශ්‍රී ලංකා වේලාවෙන්) අවසන් කෙරේ.

03. ලංසු ඉදිරිපත් කිරීම ආපසු ගෙවනු නොලබන රු. 2,500 ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් 2015.06.03 ප.ව . 3.00 දක්වා (ශ්‍රී ලංකා වේලාවෙන්) ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල පමණක් ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මධ්‍යස්ථාන කාර්යාලයේ දී ලංසු විවෘත කිරීම සිදු කෙරේ. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසු කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පැමිණෙන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10
ශ්‍රී ලංකාව.

06. ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම, ගාස්තු ගෙවීමකින් තොරව ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී සිදුකළ හැකි ය.

07. වැඩිදුර විස්තර සඳහා මෙසේ විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කට් මාවත, කොළඹ 10.

දුරකථන අංකය : 94 (11) 2473328
ෆැක්ස් අංකය : 94 (11) 2432044
ඊමේල් : Srs. slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7166.

05-148

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**ශ්‍රී ලංකා දුම්රිය සේවයට, සිමෙන්ති බෑග් 7,000ක් ඇස්බෙස්ටෝස් සෙවිලි තහඩු 11,850ක් ඇස්බෙස්ටෝස් පැතලි (Flat) තහඩු 1,750ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය SRS/F. 7180**

01. කොළඹ 10, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) හි, සභාපති විසින්, සිමෙන්ති බෑග් 7,000ක්, ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු 11,850ක් සහ ඇස්බැස්ටෝස් පැතලි (Flat) තහඩු 1,750ක් සැපයීම සඳහා 2015.05.26 වැනි දින ප. ව. 2.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු භාර ගනු ලැබේ.

පහත සඳහන් එක් එක් අයිතමය සඳහා ලංසු වෙන වෙනම අගයනු ලබන අතර, වෙන වෙන ම (කොන්ත්‍රාත්) ප්‍රදානය කරනු ලැබේ.

| *අයිතම අංකය* | *විස්තරය* | *ප්‍රමාණය* | *ගෙනැවිත් භාරදිය යුතු කාලසීමාව* |
|---|---|---|---|
| 01. | සිමෙන්ති බෑග් (එකක් කි. ග්‍රෑ. 50 බැගින්) | 7,000 | මාස 06 |
| 02. | ඇස්බෙස්ටෝස් සෙවිලි තහඩු | | |
| | (අ) දිග 6' 00" | 2,850 | මාස 06 |
| | (ආ) දිග 8' 00" | 4,500 | මාස 06 |
| | (ඇ) දිග 1'0 00" | 4,500 | මාස 06 |
| | (ඈ) ඇස්බෙස්ටෝස් පැතලි තහඩු (4' 00" x 4' 00") | 1,750 | මාස 06 |

02 ආපසු ගෙවනු නොලබන රු. 3,000 ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2015.05.25 වැනි දින ප. ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි "ආකෘති පත්‍ර මත පමණක් ලංසු" ඉදිරිපත් කළ යුතු ය.

03. ලංසු භාර ගැනීම 2015.05.26 වැනි දින ප. ව. 2.00 ට අවසන් වනු ඇත.

04. ලංසු, එම ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දුම්රිය සේවා මූලස්ථාන කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. එම ලංසු විවෘත කිරීමේ අවස්ථාවට පැමිණ සිටින ලෙස, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් හට ආරාධනය කරනු ලැබේ.

05. ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය සේවා මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂාකර බැලිය හැකිවන අතර, වැඩිදුර විස්තර සඳහා කරුණාකර දුම්රිය ගබඩා අධිකාරී වෙතින් විමසන්න.

දුරකථන අංක : 94 (11) 2438078, 2436818, ෆැක්ස් අංකය : 94 (11) 2432044.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F 7180

05-149

**මහාධිකරණය - මොණරාගල**

රාජසන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම

මොණරාගල මහාධිකරණයේ හා මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අවසන්ව රාජසන්තක කරන ලද පහත උපලේඛනයේ සඳහන් වාහන ටෙන්ඩර් මගින් විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

02. ටෙන්ඩර්පත් මොණරාගල මහාධිකරණය විසින් නිකුත් කරනු ලබන අයදුම්පත් පමණක් විය යුතු අතර, 2015.05.08 වැනි දින සිට 2015.05.18 වැනි දින දක්වා මොණරාගල මහාධිකරණයේ කාර්යාලයෙන් රු. 100 ක් ගෙවා ටෙන්ඩර්පත් ලබාගත හැකි ය.

03. ටෙන්ඩර්පත් පිටපත් 02කින් යුක්ත විය අතර, ඉන් එකක් මුල් ලේඛනය ලෙසද, අනෙක අනුපිටපත ලෙසද ලියා 9 x 4 ප්‍රමාණයේ ලිපි කවර දෙකක දමා එම කවර දෙක ඊට ප්‍රමාණයෙන් විශාල කවරයක බහා ඉදිරිපත් කළ යුතු ය. එසේ ම එක් එක් වාහන සඳහා වෙන වෙන ම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතු ය.

04. ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් "රෙජිස්ට්‍රාර්, මහාධිකරණය, මොණරාගල" යන ලිපිනයට හෝ අතින් භාර දිය යුතු අතර, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "වාහන සඳහා මිල ගණන්" වාහන අංක ........................... දරන වාහනය සඳහා මිල ගණන් යනුවෙන් සඳහන් කළ යුතු ය.

05. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේ දී ආපසු ගෙවනු ලබන පහත සඳහන් පරිදි ඇප තැන්පතුවක් මොණරාගල මහාධිකරණයේ තැන්පත් කර ඊට නිකුත් කළ කුවිතාන්සියේ පිටපතක් ටෙන්ඩර්පතට අමුණා තිබිය යුතු ය.

06. 2015.05.19 දින පෙ. ව. 10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් පමණක් විය යුතු ය. එම වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. 2015.05.08 වැනි දින සිට මෙම වාහන අතරින් අංක 01 -04 දරන වාහන මොණරාගල මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් මහතාගේ අවසරය ඇතිව මොණරාගල මහාධිකරණයේ දීත්, අංක 05 - 11 දරන වාහන මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයෙ රෙජිස්ට්‍රාර් මහත්මියගේ අවසරය ඇතිව මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දීත් සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 9.00 සිට ප. ව. 4.00 දක්වා පරීක්ෂා කර බැලිය හැකි ය.

08. ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් පසු සාර්ථක ටෙන්ඩර්කරුවන් වෙත මොණරාගල මහාධිකරණයේ ලියාපදිංචි තැපැල් මගින් දන්වා යවනු ලබන අතර, එදින සිට සති 02ක් ඇතුළත සම්පූර්ණ මුදල් එකවර තැන්පත් කර වාහනය ඉවත් කර ගත යුතු ය. එසේ නොවන අවස්ථාවන්හිදී අදාළ ටෙන්ඩර්කරුගේ තැන්පත් ඇප මුදල රාජසන්තක කරනු ලැබේ. එසේ ම අදාළ කාලය තුළ මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් තක්සේරු මුදලට වැඩියෙන් ඊළඟ වැඩිම වටිනාකමට ඉල්ලුම් කර ඇති ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය පිරිනමනු ලැබේ.

09. 2015.05.19 වැනි දින ප. ව. 2.00 ට මොණරාගල මහාධිකරණයේ දී ටෙන්ඩර්පත් විවෘත කරනු ලබන අතර, ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගි විය හැකිය. එසේ නියෝජිතයෙකු සහභාගි කරන අවස්ථාවක දී කොන්දේසි පත්‍රය සමග අමුණා ඇති ආකෘතිය සම්පූර්ණ කර එවිය යුතු ය. ටෙන්ඩර්කරුගේ හෝ නියෝජිතගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

10. ටෙන්ඩර් භාර ගැනීම, විවෘත කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම පිළිබඳ බලතල ටෙන්ඩර් මණ්ඩලය සතුවන අතර, මේ සම්බන්ධ වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ දුරකථන අංක 055 - 2276696 ඔස්සේ මොණරාගල මහධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙතින් ලබා ගත හැකි ය.

**උපලේඛනය**

| අනු. අංකය | නඩු අංකය | වාහනයේ ලියාපදිංචි අංකය | වර්ගය/මාදිලිය | ඇප තැන්පතු | වාහනය පරීක්ෂා කළ හැකි ස්ථානය |
|---|---|---|---|---|---|
| 01. | 60/14 | WP HA 2421 (ලි. ප. කළ හැකිය) | ෆෝර්ඩ් ලේසර් කාර් රථය | 10,000 0 | මහාධිකරණය, මොණරාගල |
| 02. | 90/14 | UP PP 2357 (ලි. ප. කළ හැකිය) | ටාටා ACE ලොරි රථය | 5,000 0 | මහාධිකරණය, මොණරාගල |
| 03. | 159/13 | UP LE 9329 (ලි. ප. කළ හැකිය) | ඩයිහට්සු හයිජෙට් ලොරි රථය | 5,000 0 | මහාධිකරණය, මොණරාගල |
| 04. | 109/14 | SG YL 2310 (ලි. ප. කළ හැකිය) | බජාජ් ආර්ඊ 205 ත්‍රීරෝද රථය | 5,000 0 | මහාධිකරණය, මොණරාගල |
| 05. | 55679 | LC 6281 (ලි. ප. කළ හැකිය) | මහේද්‍රා මැක්සිමෝ ලොරි රථය | 5,000 0 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොණරාගල |

| අනු අංකය | නඩු අංකය | වාහනයේ ලියාපදිංචි | වර්ගය/මාදිලිය | ඇප තැන්පතු | වාහනය පරීක්ෂා කළ හැකි ස්ථානය |
|---|---|---|---|---|---|
| 06. | 60943 | 42 - 4982 (ලි. ප. කළ හැකිය) | ටාටා 1210 ලොරි රථය | 5,000 0 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොණරාගල |
| 07. | 60051 | JM 2253 (ලි. ප. කළ හැකිය) | හයිහුන්ඩායි ලොරි රථය | 5,000 0 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොණරාගල |
| 08. | 35810 | GK 4416 (ලි. ප. කළ හැකිය) | මැස්ඩා බොන්ගෝ ලොරි රථය | 5,000 0 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොණරාගල |
| 09. | 39171 | RA 1635 (ලි. ප. කළ හැකිය) | සොනාලිකා ට්‍රැක්ටර් රථය | 5,000 0 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොණරාගල |
| 10. | 55371 | RB 0579 (ලි. ප. කළ හැකිය) | ටැෆේ ට්‍රැක්ටර් රථය | 5,000 0 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොණරාගල |
| 11. | 57816 | GC 0533 46- 4122 (ලි. ප. කළ හැකිය) | මැසිෆගිව්සන් ට්‍රැක්ටර් රථය හා ට්‍රේලරය | 5,000 0 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොණරාගල |

කේ. එම්. ගිහාන් එච්. කුලතුංග,
මහාධිකරණ විනිසුරු,
ඌව පළාත්බද මහාධිකරණය, මොණරාගල.

2015 අප්‍රේල් මස 06 වැනි දින,
මොණරාගල ඌව පළාත් බද මහාධිකරණය.

05-09

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - අනුරාධපුර**

ප්‍රසිද්ධ භාණ්ඩ වෙන්දේසිය

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ, හිමිකම් නොපාන ලද නඩු අංක මැකී ඇති නඩු වාර්තා සොයා ගැනීමට අපහසු, භාණ්ඩවල අංක මැකී ඇති පහත සඳහන් භාණ්ඩ 2015.05.23 වැනි දින පෙ. ව. 10.00 ට අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර හෝ එදින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසි දින නියමිත වේලාවට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව පිළි නොගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ එවලේ ම මුදල් ගෙවා ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු බවත්, සියලුම ගෙවීම් මුදලකින් කළ යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් මිලදී ගන්නා ලද භාණ්ඩ සඳහා ගැනුම්කරු විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

07. වෙන්දේසිය පිළිබඳව පැමිණිලි කිසිවක් වෙතොත් එදින වෙන්දේසියෙන් රාජකාරි අවසන් වීමට පෙර අධිකරණය වෙත දැන්විය යුතු අතර, ඊට පසුව ලැබෙන පැමිණිලි භාරගනු නොලැබේ.

08. මෙම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳව සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බව ද වැඩිදුරටත් සඳහන් කරමි.

උමේෂ් ශානක කලංසූරිය,
මහෙස්ත්‍රාත් අධිකරණය,
අනුරාධපුරය.

2015 අප්‍රේල් මස 22 වැනි දින,
අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**භාණ්ඩ ලැයිස්තුව**

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 53687 | 15 Kg ඉලෙක්ට්‍රොනික් තරාදි 01යි |
| 02. | 52129 | 15 Kg ඉලෙක්ට්‍රොනික් තරාදි 01යි |
| 03. | 53692 | 05 L ද්‍රව මිනුම් උපකරණ 01යි |
| 04. | 53691 | 05 Kg තැටි තරාදි 01යි (01 Kg, 500 Kg, 200 g පඩි සමග) |
| 05. | 52124 | 02 Kg තැටි තරාදි 01යි (01 Kg, 500 g, 200 g පඩි සමග) |
| 06. | 53690 | 10 Kg දුණු තරාදි 01යි |
| 07. | 55234 | 50 Kg දුණු තරාදි 01යි |
| 08. | 55233 | 10 Kg දුණු තරාදි 01යි |
| 09. | 55232 | 10 Kg දුණු තරාදි 01යි |
| 10. | 57333 | 60 Kg දුණු තරාදි 01යි |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 11. | 57335 | 10 Kg දුණු තරාදි 01යි |
| 12. | 57337 | 10 Kg දුණු තරාදි 01යි |
| 13. | 52128 | 01 Kg දුණු තරාදි 01යි |
| 14. | 52127 | 10 Kg දුණු තරාදි 01යි |
| 15. | 53676 | පරිගණක යතුරු පුවරු 01යි |
| 16. | 53664 | ජංගම දුරකථන චාජර් 01යි |
| 17. | 53666 | ජංගම දුරකථන චාජර් 01යි |
| 18. | 54121 | කුඩා ප්ලාස්ටික් පුටු 01යි |
| 19. | 54701 | LGL බ්‍රේකර් 01යි |
| 20. | 54700 | ඔරේන්ජ් බ්‍රේකර් 01යි |
| 21. | 56232 | බ්‍රේකර් 01යි |
| 22. | 43299 | ඔරේන්ජ් බ්‍රේකර් 01යි |
| 23. | A1118/14 | අංක MDSDA 22 TWL 8 දරන යතුරු පැදි වැසි කොටස් 01යි |
| 24. | 60270 | ඇලුමිනියම් මුට්ටි 01යි |
| 25. | 60790 | අඩි 11, 12, 18 බැගින් දිග ලණු 03යි |
| 26. | 61305 | ප්ලාස්ටික් බේසම් 02යි, මන්නා පිහි 01යි, මේස පිහි 01යි, 01 Kg පඩිය සමග තරාදි 01යි, ජංගම දුරකථන 01යි, |
| 27. | 60668 | ග්‍රේවිස් MK 20 වර්ගයේ වතුර මෝටර් 01යි, යකඩඉනි 01, වේවැල් කුඩ 01යි, පුටු වැලය සමග මීටර් 07 දිග අඟල් 02 කලුපාට බට 01යි |
| 28. | 54467 | පොරව 01යි |
| 29. | 60806 | සවල් 01යි, උදළු 1යි, බාල්දි 01යි |
| 30. | 54495 | උදලු 02යි, අලවංගු 01යි |
| 31. | 56541 | කැති 01යි |
| 32. | 58207 | කැති 02යි |
| 33. | 46131 | කැති 01යි |
| 34. | 47367 | කැති 01යි |
| 35. | 47366 | කැති 01යි |
| 36. | 57289 | කැති 01යි |
| 37. | 57734 | කැති 01යි |
| 38. | 57043 | කැති 01යි |
| 39. | 57736 | කැති 01යි |
| 40. | 56136 | කැති 01යි |
| 41. | 52135 | කැති 01යි |
| 42. | 53829 | කැති 01යි |
| 43. | 53880 | කැති 01යි |
| 44. | 46128 | කැති 01යි |
| 45. | 47368 | කැති 01යි |
| 46. | 51687 | කැති 01යි |
| 47. | 52134 | කැති 01යි |
| 48. | 46130 | කැති 01යි |
| 49. | 46129 | කැති 01යි |
| 50. | 56207 | කැති 01යි |
| 51. | 55238 | කැති 01යි |
| 52. | 57041 | කැති 01යි |
| 53. | 58208 | කැති 01යි |
| 54. | 58206 | කැති 01යි |
| 55. | 57973 | කැති 01යි |
| 56. | 45539 | කැති 01යි |
| 57. | 46378 | කැති 01යි |
| 58. | 46377 | කැති 01යි |
| 59. | 46839 | කැති 01යි |
| 60. | 46879 | කැති 01යි |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 61. | 46841 | කැති 01යි |
| 62. | 45540 | කැති 02යි |
| 63. | 45204 | කැති 02යි |
| 64. | 54302 | කැති 01යි |
| 65. | 45977 | කැති 01යි |
| 66. | 45978 | කැති 01යි |
| 67. | 45979 | කැති 01යි |
| 68. | 45735 | කැති 01යි |
| 69. | 46381 | කැති 01යි |
| 70. | 46380 | කැති 01යි |
| 71. | 46338 | කැති 01යි |
| 72. | 46840 | කැති 01යි |
| 73. | 47363 | කැති 01යි |
| 74. | 47369 | කැති 01යි |
| 75. | 47372 | කැති 01යි |
| 76. | 34424 | කැති 01යි |
| 77. | 34425 | කැති 01යි |
| 78. | 54673 | කැති 01යි |
| 79. | 58418 | කැති 01යි |
| 80. | 61303 | කැති 02යි |
| 81. | 61304 | කැති 01යි |
| 82. | 51694 | කැති 01යි |
| 83. | 52379 | කැති 01යි |
| 84. | 57078 | කැති 01යි |
| 85. | 57042 | කැති 01යි |
| 86. | 57296 | කැති 01යි |
| 87. | 57079 | කැති 01යි |
| 88. | 57076 | කැති 01යි |
| 89. | 57293 | කැති 01යි |
| 90. | 57295 | කැති 01යි |
| 91. | 57294 | කැති 01යි |
| 92. | 57080 | කැති 01යි |
| 93. | 90003 | කැති 01යි |
| 94. | 40417 | කැති 01යි |
| 95. | 39160 | කැති 01යි |
| 96. | 45371 | කැති 01යි |
| 97. | 45730 | කැති 01යි |
| 98. | 47373 | කැති 01යි |
| 99. | 46843 | කැති 01යි |
| 100. | 45733 | කැති 01යි |
| 101. | 45734 | කැති 01යි |
| 102. | 45732 | කැති 01යි |
| 103. | 45541 | කැති 02යි |
| 104. | 45726 | කැති 01යි |
| 105. | 90605 | මන්නා පිහි 01යි |
| 106. | 35085 | පොරව 01යි |
| 107. | 62704 | ජල කරාම 01යි |
| 108. | 61579 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01යි, 12.5 Kg ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් 01යි |
| 109. | A/1530/14 | සැම්සුන් වර්ගයේ ජංගම දුරකථනය හා ඩයලොග් සිම්පත |
| 110. | A/1531/14 | ජංගම දුරකථන 02යි. ඇඳුම් සහිත ගමන් බෑග් 04යි |
| 111. | A/1532/14 | නොකියා වර්ගයේ ජංගම දුරකථන 01යි, ඩූ වර්ගයේ ජංගම දුරකථන 01, ඇඳුම් සහිත බෑග් 01යි |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 112. | 57065 | ඩීසල් ලීටර් 20 බැගින් අඩංගු බූලි 26යි, ලීටර් 10 මැනිය හැකි කරඩි 01යි, ලීටර් 05 මැනිය හැකි කරඩි 01යි, අඩි 05 දිග බටයකට සවිකර ඇති හැඩලය සහිත කරාම 01යි, පුනිලය සහිත උපකරණ 01යි |
| 113. | 57145 | ඩීසල් ලීටර් 04ක් අඩංගු බූලි 01යි, ඩීසල් ලීටර් 16ක් අඩංගු බූලි 01යි, ඩීසල් ලීටර් 20ක් අඩංගු බූලි 01යි |
| 114. | 58793 | ඩීසල් ලීටර් 20ක් අඩංගු බූලි 02යි, ලීටර් 05 මැනිය හැකි කරඩි 01යි, පුනීල 01යි, |
| 115. | 58703 | ඩීසල් ලීටර් 15ක් අඩංගු බූලි 01යි |
| 116. | 57338 | 05 Kg තැටි තරාදි 01යි, 01 Kg පඩි 01යි |
| 117. | A/3356/10 | පාපැදි 01යි |
| 118. | A/3355/10 | පාපැදි 01යි |
| 119. | A/3354/10 | පාපැදි 01යි |
| 120. | 31479 | අංක NC SH 3261 දරන සි පැන් අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය |
| 121. | 16240 | අංක රහිත සී පැන් අත්ට්‍රැක්ටරය හා ට්‍රේලරය |
| 122. | 19817 | ලි. ප. අංක NCS11763 සහ එන්ජින් අංක GA/65/035947 දරන කුබෝටා අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය |
| 123. | 98022 | අංක 44/2330 දරන ට්‍රේලරය |
| 124. | A 1289/12 | අංක 113 - 5900 දරන හොණ්ඩා යතුරු පැදිය |
| 125. | A 838/12 | අංක 148 - 1016 දරන යතුරු පැදිය |
| 126. | A 836/12 | අංක රහිත යතුරුපැදිය |
| 127. | A 1955/12 | අංක රහිත යතුරු පැදිය |
| 128. | A 2668/11 | අංක රහිත යතුරු පැදිය |
| 129. | - | හිස් වීදුරු බෝතල් තොගයක් |
| 130. | - | ප්ලාස්ටික් /යකඩ බැරල් තොගයක් |
| 131. | - | ප්ලාස්ටික් බූලි තොගයක් |

05-186

---

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - නිකවැරටිය

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. නිකවැරටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව ඉදිරිපත් කරනු ලැබූ හා රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියෝග කරන ලද සහ කාර්යාලයෙන් ඉවත් කරන ලද පහත සඳහන් ද්‍රව්‍යයන් 2015.05.16 වැනි දින පෙ. ව. 10.00 ට නිකවැරටිය දිසා මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය. වෙන්දේසියෙන් පසුව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසි කිරීමට නියමිත ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවල අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා ද්‍රව්‍යයන් සඳහා එම අවස්ථාවේදී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළයුතු අතර, චෙක්පත්, මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

ඩී. එම්. කොඩිතුවක්කු,
දිසා විනිසුරු - මහෙස්ත්‍රාත්.

2015 අප්‍රේල් මස 24 වැනි දින,
නිකවැරටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 7571 | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි 01යි |
| 02. | 10526 | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි 01යි |
| 03. | 10588 | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි 01යි |
| 04. | 5622 | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි 01යි |
| 05. | 20388 | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි 01යි |
| 06. | බී. 519/10 | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි 01යි |
| 07. | 14967 | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි 01යි |
| 08. | 21736 | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි 01යි |
| 09. | ඒ. 647/14 | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි 01යි |
| 10. | 17016 | අංක 56338 දරන නිල්පාට පාපැදි 01යි |
| 11. | ඒ. 262/14 | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි 01යි |
| 12. | 90742 | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි 01යි |
| 13. | 16072 | අංක ඩබ්. පී. ජී. බී. 4387 දරන හීරෝ හොණ්ඩා යතුරු පැදි 01යි |
| 14. | ඒ. 279/13 | අංක 108-8758 දරන හොණ්ඩා යතුරු පැදි 01යි |
| 15. | ඒ.349/14 | අංක ඩබ්. පී. ජේ. ඩබ්. 2720 දරන ලොන්සින් යතුරු පැදි 01යි |
| 16. | 17978 | ඔපෙක් ඇග්‍රෝ අබලන් අත්ට්‍රැක්ටරය හා දිරාගිය ටේලරය |
| 17. | 17979 | සීපැන් අබලන් අත්ට්‍රැක්ටරය හා අබලන් ටේලරය |
| 18. | 20359 | ඔපෙක්ස් අබලන් අත්ට්‍රැක්ටරය |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 19. | 17686 | සීපැන් අබලන් අත් ට්‍රැක්ටරය හා අබලන් ට්‍රේලරය |
| 20. | 19285 | සීපැන් අබලන් අත් ට්‍රැක්ටරය හා අබලන් ට්‍රේලරය |
| 21. | 18972 | වර්ගය නොදත් අත් ට්‍රැක්රටය |
| 22. | 22425 | ෂෙන්සින් අබලන් අත්ට්‍රැක්ටරය හා අබලන් ට්‍රේලරය |
| 23. | 16033 | සීපැන් අබලන් අත් ට්‍රැක්ටරය හා අබලන් ට්‍රේලරය |
| 24. | 12096 | ෂෙන්පින් අබලන් අත්ට්‍රැක්ටරය හා අබලන් ට්‍රේලරය |
| 25. | 54686 | ජංගම දුරකථන 01යි |
| 26. | 14967 | පොඩි රේඩියෝ 01යි |
| 27. | ඒ. 1471/13 | ජංගම දුරකථන 01යි |
| 28. | - | හිස් බෝතල් තොගයක් |
| 29. | - | හිස් කෑන් 15ක් |
| 30. | 15399 | කැති 01යි |
| 31. | 6351 | කැති 01යි |
| 32. | 2705 | ජංගම දුරකථන 01යි |
| 33. | 21460 | ජංගම දුරකථන 01යි |
| 34. | 18381 | ලොකු ගඩොල් 300ක් |
| 35. | 21492 | ඩීසල් ලීටර් 30 ක කෑන් 01යි. |

05-197

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2015/2016 වර්ෂය

**2015 ජූලි මස 01 සිට 2016 ජුනි මස 30 දක්වා**

2015 ජූලි මස 01 දින සිට 2016 ජුනි මස 30 දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයක්ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍රයෙන් සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සිය හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයන් යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සැලසුම් කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ ''අංක.......................... දරන................ රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2015.05.15 දින පෙ.ව.10.30 ට පෙර පුත්තලම ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර පුත්තලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2015.05.15 වැනි දින පෙ.ව.10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

එම්. ආර්. එම්. මලික්,
ප්‍රාදේශීය ලේකම්,
පුත්තලම.

2015 ක් වූ අප්‍රේල් මස 16 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
පුත්තලම.

*උපලේඛනය*

| අනුක්‍රමික අංකය | කොට්ඨාසය | ග්‍රාමය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|---|---|---|---|
| 01 | පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සේනකුඩිරිප්පුව | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>රාත්‍රී 8.00 | 2015.05.15<br>පෙ.ව. 10.30 | 1,000 |

05-102

---

**මණ්මුනයි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - මඩකලපුව දිස්ත්‍රික්කය**

කෝට්ටමුනයි රා තැබෑරුම් රේන්ද නැවත විකිණීම - 2015 ජූලි - 2016 ජුනි

1982.08.20 වැනි දින ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධාන අනුව මඩකලපුව දිස්ත්‍රික්කයේ, මණ්මුනයි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කෝට්ටමුනයි රා තැබෑරුම් සඳහා 2015 ජූලි මස 01 දින සිට 2016 ජුනි මස 30 දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා මණ්මුනයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් මණ්මුනයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වන ටෙන්ඩර් මණ්ඩල රැස්වීම සඳහා පැමිණ සිටිය යුතු ය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රුපියල් එක්දහස් පන්සිය (රු. 1,500) මුදලක් මණ්මුනයි උතුර ප්‍රාදේශීය ලේකම් නමින් ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් ඉල්ලුම්පත ලබා ගත හැකි ය. ටෙන්ඩර්පත සමග රිසිට්පත අමුණා තිබිය යුතු ය. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2015.05.15 වැනි දින සිට 2015.05.29 වැනි දින පස්වරු 3.00 දක්වා.

02. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% කට අඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් සහතිකය ටෙන්ඩර් පත්‍රය සමග ඇමිණිය යුතු ය.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේ නම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් නොකර ටෙන්ඩර්පත් සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ දින සිට සති දෙකක් ඇතුළත ඔබ විසින් ලබා ගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත සමග නැවත ඉදිරිපත් කරන්නේනම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

05. තැබෑරුම දැනට පවත්වන ස්ථානයේ ඉදිරි කාලයේත් අඛණ්ඩව තිබේදැයි සහතික නොමැත.

06. ලියාපදිංචි කළ පොල් හා තල් සමුපකාර සමිති මෙම රේන්ද විකිණීමේ දී සහභාගි වන්නේ නම් සමිතිය පිහිටුවා ඇති ප්‍රදේශයට අයත් රා තැබෑරුම සඳහා පමණක් ඉල්ලුම්පත ඉදිරිපත් කළ හැකි අතර, දැනට සමිතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ද හා රා තැබෑරුම බදු ගෙන පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ද මඩකලපුව දිස්ත්‍රික් සහකාර සමූපකාර සංවර්ධන කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 හා 2012.01.05 වැනි දින දරන චක්‍රලේඛය අනුව තිබිය යුතු ය.)

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මණ්මුනයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

වෙ. තවරාජා,
ප්‍රාදේශීය ලේකම්.

2015 අප්‍රේල් මස 17 වැනි දින,
මන්මුනේ උතුර,
මඩකලපුව,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**රා තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය**

| *තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* | |
|---|---|---|---|
| | | *දිනය* | *වේලාව* |
| මඩකලපුව මහ නගර සභා මායිම තුළ | TT No. 2 | 2015.05.29 | ප. ව. 3.00 |

*සටහන* .- 1. ටෙන්ඩර් මණ්ඩල 2015.05.29 වැනි දින පස්වරු 3.00 ට රැස්වේ.

2. විකුණුම් දින සුදුසු බදුකරු තෝරා නොගතහොත් නැවත විකිණීම 2015.06.16 වැනි දින ප. ව. 3.00 ට පැවැත්වේ.

05-11

---

මගේ අංකය : ආර/ආ/01/08/01 .

**ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2015/2016 වර්ෂය

**2015 ජූලි සිට 2016 ජුනි දක්වා**

2015 ජූලි 01 දින සිට 2016 ජුනි 30 දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු 20 වැනි දින අංක 2017 දරන *ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසයෙන් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

3. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක ............. රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2015.05.19 වැනි දින පෙ. ව. 10.30 ට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බාහාලිය යුතු ය.

4. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

5. 2015.05.19 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩර්පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ තැබෑරුම් සඳහා නැවත විකිණීම 2015.06.05 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම යථෝක්ත ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

6. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

දිලාන් ගුණරත්න,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
ආරච්චිකට්ටුව.

2015 අප්‍රේල් මස 25 වැනි දින.

**උපලේඛනය**

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් කළ යුතු මුදල රු. ශත* |
|---|---|---|---|---|
| ආනවිලුන්දාව | කරුකුපනේ | 10 | 2015.05.19 පෙ. ව. 10.30 | 1,000 0 |
| ආනවිලුන්දාව | ආරච්චිකට්ටුව | 11 | 2015.05.19 පෙ. ව. 10.30 | 1,000 0 |
| ආනවිලුන්දාව | බත්තුළුඔය | 12 | 2015.05.19 පෙ. ව. 10.30 | 1,000 0 |

05-12

---

**නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - පුත්තලම දිස්ත්‍රික්කය

**(2015 ජූලි මස 01 වැනි දින සිට 2016 ජූනි 30 වැනි දින දක්වා කාලය සඳහා 2015/2016 වර්ෂය)**

2015 ජූලි මස 01 වැනි දින සිට 2016 ජූනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයක්ම සඳහා අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් රේන්ද විකිණීම සඳහා වූ ටෙන්ඩර් 2015.05.20 වැනි දින පෙ. ව. 10.30 දක්වා ම විසින් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, නියමිත ඇප තැන්පත් කුවිතාන්සියක් ද, අදාළ ටෙන්ඩරයේ සඳහන් මිලෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ "අංක 01 - මුදුකටුව රා තැබෑරුම" හෝ "අංක 02 කටුනේරිය - රා තැබෑරුම" සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි රා තැබෑරුමෙහි නම සහ අංකය සඳහන් කොට 2015.05.20 වැනි දින පෙ.ව. 10.30 ට පෙර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළවී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද විකිණීමේ කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2015 මැයි මස 20 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2015.06.08 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

එන්. ඒ. ඒ. පී. එස්. නිස්සංක,
ප්‍රාදේශීය ලේකම්,
නාත්තන්ඩිය.

2015 අප්‍රේල් මස 10 වැනි දින,
නාත්තන්ඩිය,
ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| අනුක්‍රමික අංකය | කොට්ඨාසය | ග්‍රාමය | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|---|
| 01. | නාත්තන්ඩිය | මූදුකටුව | 1,000 |
| 02. | නාත්තන්ඩිය | කටුනේරිය | 1,000 |

05-45

---

**මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනයි දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

එරුවිල් සහ මාංකාඩු රා තැබෑරුම් රේන්ද විකිණීම - 2015 ජූලි 2016 ජුනි

අංක 207 දරන 1982.08.20 දින ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධාන අනුව මඩකලපුව දිස්ත්‍රික්කයේ මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය එරුවිල් සහ මාංකාඩු රා තැබෑරුම් සඳහා 2014 ජූලි මස 01 දින සිට 2015 ජුනි මස 30 දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වන ටෙන්ඩර් මණ්ඩල රැස්වීම සඳහා පැමිණි සිටිය යුතු ය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රුපියල් එක්දහස් පන්සිය (රු. 1,500) ක මුදලක් මන්මුනේ දකුණ ප්‍රාදේශීය ලේකම්තුමා නමින් ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉල්ලුම්පත ලබා ගත හැක. ටෙන්ඩර්පත සමග රිසිට්පත අමුණා තිබිය යුතු ය. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2015.05.11 වැනි දින සිට 2015.05.20 වැනි දින ප. ව. 3.00 දක්වා පමණි.

02. ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් බදු පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% ට නොඅඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් සහතික බදුපත්‍රය සමග ඇමිණිය යුතු ය.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේ නම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් නොකර ටෙන්ඩර්පත්‍ර සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කරන ලද දින සිට සති දෙකක් ඇතුළත ඔබ විසින් ලබාගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත සමග නැවත ඉදිරිපත් කරන්නේ නම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

05. දැනට තිබෙන තැබෑරුම් ඉඩම ඉදිරි කාලවලටත් අඛණ්ඩව තිබේදැයි සහතික නැත.

06. ලියාපදිංචි කරන ලද පොල් සහ තල් සමූපකාර සමිති මෙම රේන්ද විකිණීමේ දී සහභාගි වන්නේ නම් සමිතිය පිහිටුවා තිබෙන ප්‍රදේශයට අයත් රා තැබෑරුමට පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ හැකිය. ඒ සමග සංගමය දැනට ක්‍රියාකාරිත්වය පිළිබඳව ද හා රා තැබෑරුම් බදු ගෙන පවත්වා ගෙන යැමට හැකියාව තිබීම සම්බන්ධව මඩකලපුව දිස්ත්‍රික් සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 හා 2012.01.05 වැනි දිනැති චක්‍රලේඛයට අනුව)

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මණ්මුනයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැක.

එම්. කෝපාලරෙත්තිනම් මයා,
ප්‍රාදේශීය ලේකම්,
මන්මුනේ දකුණ එරුවිල්පත්තු
කළුවාන්චිකුඩි.

2015 අප්‍රේල් මස 08 වැනි දින.

**රා තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථාන**

| රා තැබෑරුමට අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථාන | තැබෑරුම් අංකය | ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | |
|---|---|---|---|---|
| එරුවිල් ගම | එරුවිල් | TT No. 4 | 2015.05.21 | පෙ. ව. 11.30 |
| මාංකාඩු ගම | මාංකාඩු | TT No. 6 | 2015.05.21 | පෙ. ව. 11.30 |

*සටහන .-* 1. ටෙන්ඩර් මණ්ඩලය 2015.05.21 වැනි දින පෙ. ව. 11.30 ට රැස්වේ.

2. විකුණුම් දින සුදුසු බදුකරු තෝරා නොගතහොත් නැවත විකිණීම 2015.06.04 වැනි දින පෙ. ව. 11.30 ට පැවැත්වේ.

05-01

---

**මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - පුත්තලම දිස්ත්‍රික්කය**

**2015 ජූලි මස 01 සිට 2016 ජුනි මස 30 දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම - 2015/2016 වර්ෂය**

2015 ජූලි මස 01 වැනි දින සිට 2016 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා නියමිත ආකෘති පත්‍රයෙන් සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සිය හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සැලසුම් කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ "අංක.................................... දරන.......................................... රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ අංකය සහ නම සඳහන් කොට 2015.05.26 වැනි දින පෙ.ව. 10.30 ට පෙර මුන්දලම ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තබා ඇති, ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය.

